**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2016 මාර්තු 14 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සංවර්ධන යෝජනා 06 ක් වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු.149,096 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,137,766 ක් වූ සේවක ණය අදාල උපලේඛනය අනුව රු.1,153,893 ක් වූ අතර, රු.222,019 ක් වූ හිඟ බදුකුලී, ආදායම් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය අනුව රු.633,658 ක් විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) **ලැබිය යුතු ගිණුම්**

2016 දෙසැම්බර් 31 දිනට රු.28,653,053 ක් වූ ලැබිය යුතු ගිණුම්වලින් රු.5,936,613 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

2016 දෙසැම්බර් 31 දිනට රු.16,130,462 ක් වූ ගෙවිය යුතු ගිණුම් වලින් රු.5,558,644 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල පියවා නොතිබුණි.

#### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

ගිණුම් විෂයයන් 06 කට අදාල උපලේඛන, වත්කම් ලේඛන හා අක්කර බදු ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 39,353,429 ක් වූ වත්කම් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම්**

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 158 වගන්තිය | සභා බලප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ගේ චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රා දේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | 203 රීතිය | සභාව සතු සියළුම වත්කම් සෑම වර්ෂයක් අවසානයේදීම සමීක්ෂණය කිරීම සිදුකර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,810,047 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,258,030 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීම කෙරෙහි පුනරාවර්තන වියදම වැඩිවීම සහ සභාවේ උත්පාදිත නොවන ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 41ක් වූ අතර, එයින් රුපියල් මිලියන 29 ක් සමාලෝචිත වර්ෂය තුල රැස්කරගෙන තිබුණි.

**2.3.2 වරිපනම් බදු**

2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.999,771 ක් වූ වරිපනම් බදුවලින් රු.719,681 ක් වසරක කාලයක් ඉක්මවා අයවීමකින් තොරව පැවතුණි.

**2.3.3 බදු කුලී**

රු.222,019 ක් වූ හිඟ බදු කුලී අයකර ගැනීමේ කාල ප්‍රමාදයක් පැවතුණි.

**2.3.4 කඩකුලී**

---------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,135,294 ක් වූ හිඟ කඩකුලියෙන් රු.714,952 ක් වර්ෂ 1- 3 ත් අතරද, රු.67,019 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් තුළද අයනොවී පැවතුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

වයඹ පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.887,668 ක් වූ උසාවි දඩ සහ රු.5,572,779 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------

පහත කරුණු අනාවරණය විය.

(අ) සභා බලප්‍රදේශයේ අක්කර බදු අයකල යුතු ඉඩම් හඳුනා ගැනීමට හා ඒවායින් බදු මුදල් අයකර ගැනීමට වර්ෂ ගණනාවක සිට කටයුතු නොකර අතීතයේ සිට පැවත එන අක්කර බදු ලේඛනය පදනම්ව දිගින් දිගටම බිල්කිරීම පමණක් සිදුකර තිබුණි.

(ආ) සභාව සතු කඩකාමර කුලී පදනම මත ව්‍යාපාරිකයින්ට ලබාදීමේදී ගිවිසුම්වලට එළඹ නොතිබුණු අවස්ථා විය.

(ඇ) සභාව සතු ස්මයිල්පුරම් මහජන පුස්තකාලය 2016 දෙසැම්බර් 21 දින සිට වසා දමා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත වටිනාකම වූ රු.6,072,779ක් ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) 2016 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ඊ) සභාවේ විධායක ශ්‍රේණියේ තනතුරක, ද්විතියික ශ්‍රේණියේ තනතුරු 10 ක හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 04 ක පුරප්පාඩු පැවති අතර, අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 03 ක 11 දෙනෙකු අනියම් පදනමින් ද අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරුවලින් බැහැරව ද්විතියික ශ්‍රේණියේ තනතුරක සේවකයින් 08 දෙනෙකු ද සේවයේ යොදවා තිබුණි.

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

අමාත්‍යවරයාගේ අනුමැතියක් ලබා නොගෙන ගභේවාඩිය සංචාරක බංගලාව 2015 මැයි 13 දින සිට වසර 30 ක බදුකාලයක් සඳහා කිසිදු තක්සේරුවකින් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව රු.30,100 ක් වූ මාසික බදු මුදලකට සහ වාර්ෂිකව සියයට 10 කින් බදු මුදල වැඩිවීමේ පදනමින් බදු දී තිබුණි. තවද, සුනාමි ව්‍යසන අවස්ථාවේ දී සභාව වෙත ආධාර වශයෙන් ලැබී තිබුණු අශ්වබල 125 එන්ජිමක් සහිත ෆයිබර් බෝට්ටුව ද 2016 ජනවාරි සිට මාසිකව රු.15,100 ක කුලී පදනම මත උක්ත බදුකරු වෙතම ලබාදී තිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

--------------------

පහත කරුණු අනාවරණය විය.

(අ) වනාතවිල්ලුව සහ කරතිව් මහජන පුස්තකාලවල අස්ථානගත පොත් 657 ක වටිනාකම වූ රු.109,945 ක් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.2,947,090 ක් වැයකර ඉදිකර තිබුණු කොම්පෝස්ට් අංගනයේ දෛනික නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය සේවකයින් ප්‍රමාණය නොයෙදවීම මත අදාල ව්‍යාපෘතිය අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය වත්කම්

රු.1,070,000 ක් වටිනා වත්කම් 19 ක් වර්ෂ 01 ත් 06 ත් අතර කාල පරාසයක් තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

**අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රාග්ධන වැය රු.37,642,000 ක් වූ අතර, එහි තථ්‍ය රු.10,655,502 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම අයවැයගත ප්‍රාග්ධන වියදමෙන් සියයට 28 ක් වූ අඩු අගයකින් සිදුකර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දූර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මඟින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ආදායම් රැස්කිරීම | හිඟ ආදායම් වර්ෂයෙන් වර්ෂය වර්ධනය වීම හා හිඟ ආදායම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබීම. |
| (ආ) | පුස්තකාල පරිපාලනය | පාඨක සමාජ ශක්තිමත් කිරීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ලේඛන නඩත්තුව | උපයෝගී ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම (උදා:- ණයගැති හා ණයහිමි ලේඛන) |
| (ඈ) | අයවැය පාලනය | අයවැයගත සහා අරමුදල් මඟින් කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබීම. |
| (ඉ) | කසළ කළමනාකරණය | කසළ ප්‍රතිචක්‍රීයකරණය සඳහා ආරම්භ කර තිබුණු ව්‍යාපෘතිය නියමිත පරිදි ක්‍රියාත්මක නොවීම මත දෛනිකව එකතුවන කසල පරිසර හානි සිදුවන අයුරින් බැහැර කිරීම. |